**<u>පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ 2025.10.08 වන දින පැවැති මහ සභා රැස්වීම් වාර්තාව.</u>**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීම 2025 ඔක්තෝම්බර් මස 08 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

ඒ සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් සහභාගී විය.

| | | | |
|---|---|---|---|
| 02. | ගරු ප්‍රාදේශීය සභා උප සභාපති | - | එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා. |
| 03. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ඩී.ඩබ්.සෝමරත්න මැතිතුමා |
| 04. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.සරත් උෂාන් මහානාම මැතිතුමා. |
| 05. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඩී.රුවන් වානක පියරත්න මැතිතුමා. |
| 06. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා. |
| 07. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.වී.නිර්මික දීපාල් අබේවර්ධන මැතිතුමා. |
| 08. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ජී.චන්ද්‍රලාල් මැතිතුමා. |
| 09. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා. |
| 10. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා. |
| 11. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.ඒ.පුෂ්පකුමාර ධනසේකර මැතිතුමා. |
| 12. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා. |
| 13. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා. |
| 14. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ටී.කේ.සම්පත් සිරිශාන්ත මැතිතුමා. |
| 15. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එල්.යුරේෂ් පුෂ්පකුමාර මැතිතුමා. |
| 16. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ශාන්ත පුෂ්පකුමාර කුඩාවත්ත මැතිතුමා. |
| 17. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | මයුරි චතුරිකා පරණමාන්න මැතිතුමිය. |
| 18. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.වසන්ත කුමාරසිරි මැතිතුමා. |
| 19. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | රාජේන්ද්‍රන් තිෂෝක් මැතිතුමා. |
| 20. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජී.ඉන්දික කුමාර මැතිතුමා. |
| 21. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.එම්.ඒ.ඉසුරු සම්පත් අලගියවන්න මැතිතුමා. |
| 22. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | බී.තුෂාරි දමයන්ති සිල්වා මැතිතුමිය. |
| 23. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | එච්.ඥානලතා හපුතන්ත්‍රි මැතිතුමිය |
| 24. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.මොහාන් මංජුල මැතිතුමා |
| 25. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | එම්.සුලාරි සඳරේඛා මාකාවිට මැතිතුමිය. |
| 26. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා. |
| 27. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | වී.ඉන්දික උදයකුමාර ගුණවර්ධන මැතිතුමා. |
| 28. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා. |
| 29. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.එෆ්.ජගත් සේනාරත්න මැතිතුමා. |
| 30. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා. |
| 31. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | රාජරත්නම් පුවනේස්වරී මැතිතුමිය. |
| 32. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | එම්.ප්‍රදීපා ඉදුමිණි කුලරත්න මැතිතුමිය. |
| 33. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ජෙහන් මෝහන් මැතිතුමා. |
| 34. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.ධනේෂ් කුමරන් මැතිතුමා |

පැමිණ සිටි සියලු දෙනාම ආගම සිහි කර , ගරු සභාපතිතුමන් විසින් අද දින මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින ගරු උප සභාපති තුමා, ගරු විපක්ෂ නායකතුමා ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා ද, ලේකම්තුමා හා නිලධාරීතුමිය ද පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

**01.පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම.( 2025.09.11).**

2025.09.11 දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

**02.සභාපතිවරයා විසින් සභාව වෙත ඉදිරිපත් කළ යුතු නිවේදන.**

පළාත් පාලන සතිය නිමිත්තෙන් සිදු කළ වැඩසටහන් සඳහා වූ රු. 673,898.80 වියදම් වාර්තාව දැනගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරන ලදි.

2025.08.20 වන දින මහ සභාව සඳහා ඉදිරිපත් කරන ලද සභික යෝජනා වල ප්‍රගතිය ගරු සභාවට ඉදිරිපත් කරන ලදි.

* ගරු ප්‍රාදේශීය සභා උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමාගේ යෝජනා අංක 01,02- ග්‍රාමීය සංවර්ධන යෝජනා යටතට ඇතලත් බැවින් සභාව මැදිහත් වීමක් නොවන බවත්,අංක 03හි යෝජනාව විෂය පථයට අදාළ නොවන බව ප්‍රකාශ කරන ලදි.

* ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.මොහාන් මංජුල මැතිතුමාගේ යෝජනා අංක 01 - ග්‍රාමීය සංවර්ධන යෝජනා යටතේ දැනටමත් මෙම සංවර්ධනය ක්‍රියාත්මක වන බවත්,

* ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී එච්.ඥානලතා හපුතන්ත්‍රි මැතිතුමියගේ යෝජනා අංක 01,02,03- ග්‍රාමීය සංවර්ධන යෝජනා යටතේ දැනටමත් මෙම සංවර්ධනය ක්‍රියාත්මක වන බවත්,

* ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමාගේ යෝජනා අංක 01-බැකෝ යන්ත්‍රය අලුත්වැඩියා කල පසු මෙම යෝජනාව සළකා බලන බවත්, යෝජනා අංක 02-මෙම යෝජනාව පැහැදිළි නොවන හෙයින් මාර්ගය ප්‍රාදේශීය සභාවට අයත් පාරක්ද යන්න පැහැදිළිව ඉදිරිපත් කරන ලෙසත්, යෝජනා අංක 03- ග්‍රාමීය සංවර්ධන යෝජනා යටතට ඇතුලත් බැවින් සභාව මැදිහත් වීමක් නොවන බවත්, යෝජනා අංක 04-සභාව මැදිහත් වී සිදු කරන බවත්, යෝජනා අංක 05- මෙම යෝජනාව සම්බන්ධිකරණ කමිටුවට ඉදිරිපත් කිරීමෙන් පසුව මැණික් හා ස්වර්ණාභරණ

අධිකාරිය මඟින් බැකෝ පතල් නවතා ඇති බවත්,මේ සඳහා පරීක්ෂණයක් සිදු වන බවත්,

* ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එම්.සුලාරි සඳරේඛා මාකාවිට මැතිතුමියගේ යෝජනා අංක 01- මෙම සංවර්ධනය සම්බන්ධයෙන් තක්සේරුවක් සිදු කර සභාව හරහා සිදු කිරීමට හැකිද නොමැති නම් රජයේ සංවර්ධන යෝජනා වලට ඇතුළත් කිරීමටත්, යෝජනා අංක 02,03- ග්‍රාමීය සංවර්ධන යෝජනා යටතට ඇතුලත් බැවින් සභාව මැදිහත් වීමක් නොවන බවත්, යෝජනා අංක 04-ඉදිරියේදී සිදු කිරීමට නියමිත බවත්, යෝජනා අංක 05- ග්‍රාමීය සංවර්ධන යෝජනා යටතට ඇතුලත් බැවින් සභාව මැදිහත් වීමක් නොවන බවත්,

* ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඉන්දික උදයකුමාර ගුණවර්ධන මැතිතුමාගේ යෝජනා අංක 01- දැනටමත් සිකුරාදා දිනයේ නොදිරන කසළ එකතු කරන බවත්, ට්‍රැක්ටර් රථ අලුත්වැඩියාවෙන් පසුව දිරන කසළ එකතු කිරීම පිළිබඳ අවධානය යොමු කරන බවත්,

* ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමාගේ යෝජනා අංක 01- බැකෝ යන්ත්‍රය අලුත්වැඩියා කල පසු මෙම යෝජනාව සළකා බලන බවත්, යෝජනා අංක 02- සභාවේ වාහන වල ඉන්ධන වාර්තාවක් මහ සභාවේදී ඉදිරිපත් කරන ලදි.

* ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එෆ්.ජගත් සේනාරත්න මැතිතුමාගේ යෝජනා අංක 01,03 - ග්‍රාමීය සංවර්ධන යෝජනා යටතට ඇතලත් බැවින් සභාව මැදිහත් වීමක් නොවන බවත්, යෝජනා අංක 02-පනතට අදාළ නොවන හෙයින් මැදිහත් වීමක් නොවන බවත්,

* ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එල්.යුරේෂ් පුෂ්පකුමාර මැතිතුමාගේ යෝජනා 01-05- ග්‍රාමීය සංවර්ධන යෝජනා යටතට ඇතලත් බැවින් සභාව මැදිහත් වීමක් නොවන බවත්,

* ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජෙහාන් මෝහන් මැතිතුමාගේ යෝජනා 01- පනතට අදාළ නොවන හෙයින් මැදිහත් වීමක් නොවන බවත්, යෝජනා 02-ඉදිරියේදී සලකා බලන බවත්,

* ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ධනේෂ් කුමරන් මැතිතුමාගේ යෝජනා 01,02- ග්‍රාමීය සංවර්ධන යෝජනා යටතට ඇතුලත් බැවින් සභාව මැදිහත් වීමක් නොවන බවත්,

* ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්.එම්. ශ්‍රියානි වීරසේකර මැතිතුමියගේ යෝජනා 02 -කාර්මික නිලධාරි ස්ථානීය පරීක්ෂණයක් සිදු කළ බවත් එම පුදගලයන්ට අවවාද කිරීමටත් ඉදිරියේදි නීතිමය ක්‍රියාමාර්ග ගැනිම සිදු කරන බවත්,

ගරු සභාවට ප්‍රකාශ කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඉන්දික උදයකුමාර ගුණවර්ධන මැතිතුමා පෙ.ව.10.30ට සභාවෙන් පිටවන ලදි.

**03.සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා.**

අසනීප තත්වයක් හේතුවෙන් සභාවට පැමිණීමට නොහැකි බව දන්වා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්.එම්. ශ්‍රියානි වීරසේකර මැතිතුමිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ටී.ශ්‍රියානි ජානකී පීරිස් මැතිතුමිය,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එච්.ජී.සචිනි සෙව්වන්දි මැතිතුමියගේ නිවාඩු අනුමත කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී මයුරි චතුරිකා පරණමාන්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**04. ගරු සභාව අමතා එවන සංදේශ, මහජන පෙත්සම්/පැමිණිලි සභාව ඉදිරියේ තැබීම.-නැත**

**05.යථා පරිදී කල් දී ඇති ප්‍රශ්න**

01.පොළ පැවැත්වෙන භූමිය තුළට පවරා ඇති නඩුවේ වර්තමාන තත්වය කුමක්ද?

**<u>පිළිතුර 01</u>**

සභාවට අයත් ඉහත ඉඩම් කොටසට අයිතිවාසිකම් ඇති බව සඳහන් කරමින් නඩු පවරා ඇත.

| | | |
|---|---|---|
| නඩු අංකය | - 5741 | රාජකරුණා සෙනෙවිරත්න දිසානායක |
| මුදල | -රු.6,500,000.00 | මුදියන්සේ රාළහාමිගේ චන්දන |
| ස්වාභාවය | - ඉඩම් | බැමිණියවත්ත බණ්ඩාර වෙරළුප වලව්ව |
| | | වෙරළුප,රත්නපුර |
| | | පැමිණිළිකරු |
| | | 01.ලියනවඩු ආරච්චිගේ ජගත්සිරි ලියනගේ |
| | | අංක 06/159,ඉහළ බෝපිටිය පාර,කළුගම්මුල්ල,පැල්මඩුල්ල |

සහ තවත් අයෙක් එරෙහිව පැල්මඩුල්ල ගරු දිසා අධිකරණයේ නඩු පැවරීමට කටයුතු කර ඇත.(2019.11.28 දින සඳහන් කාර්ය සටහන් වාර්තාවේ සටහන් පරිදී) වෙනත් බාහිර පාර්ශවයන් විසින් සභාවේ ඉඩමට නඩු හබයක් පවත්වාගෙන යාම නිසා සභාව විසින් තමාගේ අයිතිවාසිකම් වෙනුවෙන් නීතිඥ සීතා රංජනී වික්‍රමපාල මහත්මියගේ නීති උපදෙස් අනුව සිවිල් නඩු විධාන සංග්‍රහ පනතේ 18 වන වගන්තිය අනුව මෙම නඩුවේ ආන්තරික පෙත්සම්කරුවෙකු ලෙස පිළිගන්නා ලෙසට අධිකරණයෙන් කරන ලද ඉල්ලීමද ගරු අධිකරණයේ විනිසුරු තුමිය හේතු දක්වමින් ප්‍රතික්ෂේප කර ඇත. තවද විත්තිකරුවෙකු ලෙස නම් කරන ලෙසට කරන ප්‍රතික්ෂේප කර ඇත.( ගරු අධිකරණය මඟින් 2020.02.20 ලබා දෙන ලද නියෝගයේ සඳහන් වේ)

නඩුවෙන් ඉවත් කිරීම නිසා 2020 අගෝස්තු 13වන දින පැවති මහා සභාවේ ගත් තීරණය අනුව නීතිඥ නන්දපාල වික්‍රමසූරිය මහතා මඟින් ලබා දෙන ලද තීන්දුවට එරෙහිව රත්නපුර සිවිල් අභියාචනාධිකරණයේ නඩු පැවරීමට කටයුතු කර ඇත.(නඩු අංක HC/RA/11/2020 යටතේ නඩු පැවරීමට කටයුතු කර ඇත)

සිවිල් අභියාචනාධිකරණයේ පවරන ලද නඩුව 2020.09.10 වන දින ආරම්භ කර 2022.02.10 වන දින තීන්දුව ප්‍රකාශයට පත් කර ඇත.(මහාධිකරණයෙන් ලබා ගන්නා ලද කාර්යය සටහන් වාර්තාව අනුව) රත්නපුර අභියාචනා මහාධිකරණයේ නියෝග අනුව ප්‍රාදේශීය සභාවද එකතු කරන ලද පාර්ශවය ලෙස 2023.04.28 වන දින සිට පැල්මඩුල්ල දිසා අධිකරණයේ මෙම නඩුව විභාග වෙමින් පවතී අවසන් වරට 2025.07.03 වන දින විභාගයට ගෙන ඇති අතර නඩු දිනය 2025.12.11 දිනය වේ.ආන්තරික පෙත්සම් පාර්ශවය ලෙස මෙම දේපළට අදාළව සභාවට ඇති අයිතිය තහවුරු කිරීමට අවශ්‍ය ලේඛන ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.(2023.06.03 වන දින සිට 2024.02.02 දින පැවති නඩු වාරයන්ට අදාළ කාර්යය සටහන් වාර්තා ලබා ගෙන ඇත.)එම දින සිට 2025.07.03 වන දින දක්වා වූ කාර්යය සටහන් වාර්තා ලබා ගැනිමට ගරු අධිකරණයට මුදල් බැදීමට කටයුතු කර ඇත.

රත්නපුර සිවිල් අභියාචනාධිකරණයේ තීන්දුව ලබා ගැනීම සඳහා නීතිඥ නන්දපාල වික්‍රමසූරිය මහතාට ගෙවන ලද ගාස්තුව රු.550,000.00කි.

සිවිල් අභියාචනා මහාධිකරණයේ තීන්දුවෙන් පසුව ආන්තරික පෙත්සම් පාර්ශවය ලෙස සම්බන්ධ වී පැල්මඩුල්ල දිසා අධිකරණයේ විභාග වන නඩුවට පෙනී සිටින නීතිඥ සීතා රංජනී වික්‍රමපාල මහත්මියට මේ දක්වා සභාව විසින් ගෙවා ඇති මුදල රු.27,000.00කි.

සභාව විසින් මෙම නඩුව සඳහා වෙනත් වියදම් (නිලධාරී ගමන් වියදම් හැර)නීතිඥ ගාස්තු ලෙස රු.577,000.00ක මුදලක් වියදම් කර ඇත.

02.ආදාහනාගාරයේ ඉඩම තුළට වෙනත් පතල් වලින් දෝන කපා ඇති බවට සැලවීමෙන් පසු එම පතල් වල ඉල්ලම් ගරු උසාවියේ තැන්පත් කළ මැණික් හා එම නඩුවේ වර්තමාන තත්වය කුමක්ද?

**<u>පිළිතුර 02-</u>**

පැල්මඩුල්ල ආදාහනාගාර ගොඩනැගිල්ල ගල්ලෙපිටහේන හෙවත් ගල්ගොඩෙහේන නැමති ඉඩමේ පිහිටා ඇත.මෙම ඉඩමට දකුණු බැවුමේ පොදු මායිමට සීමා වන ගල්කුඹුර නැමති පුද්ගලික ඉඩම් කොටස රත්නපුර ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් පුද්ගලයින් 04 දෙනෙකුට මැණික් ගැරීම සඳහා බලපත්‍ර ලබා දීමට සූදානම් වන අවස්ථාවේදීම මැණික් පතල් ආරම්භ කිරීම නිසා ඉහළ පිහිටි ආදාහනාගාර ගොඩනැගිල්ලට හා භූමියට සිදුවන හානිය සම්බන්ධයෙන් ලේකම්තුමා විසින් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට ලිඛිතව දැනුම් දීමට කටයුතු කරන ලදි.නමුත් සංස්ථාව විසින් මැණික් ගැරීම සඳහා බලපත්‍ර ලබා දෙන ලදි.දෛනිකව එම ස්ථානයේ සිදුවූ ක්‍රියාකාරකම් අනුව ආදාහනාගාර ඉඩම තුලට පතල් දෝනා ගමන් කර ඇතිද යන්න තහවුරු කර ගැනීම සඳහා සභාව හා සංස්ථාව එක්ව පතල් පරීක්ෂාවට ලක්කරන ලදි.එම අවස්ථාවේදී නො.11,බාන්ස් රත්වත්ත මාවත,බළංගොඩ ලිපිනයේ පදිංචි හිරුණි නවෝද්‍යා බස්නායක මහත්මියට අයත් පතලයේ කැණීම් කරන ලද දෝනාවන් පොදු මායිම් අතර ඇති රක්ෂිත සීමාවන්ද උල්ලංඝනය කර ආදාහනාගාර ඉඩම තුලට ඇතුල්වී තිබූ නිසා එයින් ගොඩ දමන ඉල්ලම් පස් සංස්ථාව විසින් තහනමට ලක් කරන ලදි.

පසුව එම පස් ආරක්ෂා කිරීමේ ගැටළුවක් මතුවූ නිසා සංස්ථාව, සභාව, බලපත්‍රධාරියා යන පාර්ශවයන් ඉදිරියේ සෝදා පිරිසිදු කිරීමෙන් පසුව හමුවූ මැණික් පාෂාණ සංස්ථාවේ අධිකාරී බලතල අනුව මුද්‍රාකර බලපත්‍රධාරියා භාරයේ තැබිමට කටයුතු කර ඇත.

ඉහත සඳහන් සිදුවීම සිදුවන කාලවකවානුව වන විට සභාවේ ආදාහනාගාර භූමියේ 8/3 භූමි ප්‍රමාණයකට හිමිකම් කියා පාමින් 01.මල්වත්ත ආරච්චිගේ ගාමිණී චන්ද්‍රතිලක හා 02.දෝන රොසලින් එදිරිසිංහ විද්‍යාල මාවත,පැල්මඩුල්ල ලිපිනයේ පදිංචි අයවලුන් විසින් සභාවට එරෙහිව පැල්මඩුල්ල දිසා අධිකරණයේ නඩු අංක 6840 යටතේ ඉඩම් නඩුවක් ගොනු කිරීමට කටයුතු කරන ලදි.එම පවරන ලද නඩුකරය 2021.12.10වන දින සිට 2024.02.22 වන දින දක්වා ගරු අධිකරණයේදී විභාගයට ගන්නා ලදි.2024.02.22 වන දින නඩු වාරයේදී පැමිණිළි පාර්ශවය විසින් පැමිණිල්ල ඉල්ලා අස්කර ගැනිම නිසා නඩු කටයුතු අවසන් වී ඇත.(අධිකරණයෙන් ලබා ගන්නා ලද කාර්ය සටහන් වාර්තා අනුව)

එම නඩුකරය අවසන් වීමෙන් පසුව සභාව විසින් මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් ආදාහනාගාර ඉඩමේ මායිම් නිරවුල් කර ගැනීමට කටයුතු කර වැට ගැසීමේ කටයුතු සිදු කරමින් සිටී.මායිම් ගැටළුව නිරාකරණය වී ඇති නිසා මායිම් සීමා උල්ලංඝනය වීම මත සංස්ථාව විසින් මුද්‍රාකර තබා ඇති මැණික් ඛනිජ පාෂාණ සම්බන්ධයෙන් සංස්ථාව සමඟ ඒකාබද්ධව ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් සිටින බවට දැනුම් දෙමි.

ඉහත සඳහන් තොරතුරු සභාවේ පවත්වාගෙන යනු ලබන ලිපිගොනු අනුව සකස් කරන ලද බවට ප්‍රකාශ කර සිටිමි.

**06.යථා පරිදී කල් දී ඇති යෝජනා**

**<u>I.ගරු සභාපති එම්.ජී.ඒ. ධර්මසිරි මාණිපුර මැතිතුමාගේ යෝජනා.</u>**

01.පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන කටයුතු සඳහා පහත නම් සඳහන් 2025 වර්ෂයට ප්‍රසම්පාදන කමිටුවක් පත්කිරීමට යෝජනා කරමි

| | |
|---|---|
| ගරු සභාපති | -එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා |
| ලේකම් | -ආර්.කේ.කපිල ජගත් ගුණතිලක මයා |
| කාර්මික නිලධාරී | -බී.එම්.එස්.අයි.යෝගරත්න මයා |
| | -එච්.ජයසිංහ මයා |
| සභිකයන් | -ගරු ඒ.එම්.ඒ.ඉසුරු සම්පත් අලගියවන්න මැතිතුමා |
| | -ගරු ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා |

-ගරු එම්.ඒ.පුෂ්පකුමාර ධනසේකර මැතිතුමා
-ගරු බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා
-ගරු කේ.ඩී.රුවන් චානක පියරත්න මැතිතුමා
-ගරු.වී.ඉන්දික උදයකුමාර ගුණවර්ධන මැතිතුමා

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 01</u>**

ඉහත සඳහන් ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව සහා සම්මත විය.

02.ආණ්ඩුකාර ලේකම්ගේ අංක GS/ES/06/14(I වෙළුම) හා 2025.01.15 දිනැති ලිපිය පරිදි මෙම සභාවේ කසළ කළමනාකරණය සඳහා ශ්‍රමය මිලදී ගැනීමේ පදනමින් මාස තුනෙන් තුනට සේවය බණ්ඩනය වන පරිදි අනුමත රියදුරු තනතුර සඳහා අංක 36,මාෂල්වැලිය,වැලිමළුව,ලෙල්ලෝපිටිය ලිපිනයෙහි පදිංචි තංගවේලු සුරේෂ්කුමාර් මයා බඳවා ගැනීම සුදුසු බව යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසා සිටියේ බඳවා ගැනීම් සිදු කිරීමේදී සුදුසුම පරිදි බඳවා ගැනීම් සිදු කරන ලෙසය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා පවසා සිටියේ දැනට සභාවේ ස්ථිර නොවූ රියදුරන් ස්ථිර කිරීමට වැඩපිළිවලක් සකස් කිරීම පිළිබඳ අවධානය යොමු කරන ලෙසයි.

**<u>තීරණ අංක 02</u>**

ශ්‍රමය මිලදී ගැනීමේ පදනමින් මාස තුනෙන් තුනට සේවය බණ්ඩනය වන පරිදි අනුමත රියදුරු තනතුර සඳහා අංක 36,මාෂල්වැලිය,වැලිමළුව,ලෙල්ලෝපිටිය ලිපිනයෙහි පදිංචි තංගවේලු සුරේෂ්කුමාර් මයා බඳවා ගැනීම ඒකමතිකව සහා සම්මත විය.

03.පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ නියමිත බලපත්‍රයක් නොමැතිව ජී.එල්.ඩී.ඩී.ද සිල්වා විසින් උඩතුල ග්‍රාම නිලධාරී වසමට අයත් උඩතුල මැද පාර ,රුප්පෙවත්ත මාවත, උඩතුල,පැල්මඩුල්ල ස්ථානයේ අනතුරුදායක ලෙස ඉදිකර ඇති අනවසර බැම්ම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියා මාර්ග ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා සභා මන්ත්‍රීනි බී.තුෂාරි දමයන්ති මැතිතුමිය හා කේ.ශාන්ත කුමාර කුඩාවත්ත මැතිතුමා පවසා සිටියේ මෙම බැම්ම අනතුරුදායක ලෙස ඉදිකර ඇති බවයි.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා පවසා සිටියේ මෙම බැම්ම කඩා ඉවත් කිරීමට එකඟ වූ බවත් ඒ සඳහා ටික කාලයක් ලබා දෙන ලෙසයි.

**<u>තීරණ අංක 03</u>**

මෙම අනවසර බැම්ම සම්බන්ධයෙන් ජී.එල්.ඩී.ඩී.ද සිල්වා යන අයට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

04.පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව සතු ගල්ලෙපිටහේන ආදාහනාගාර ඉඩමෙහි අනවසර පදිංචි පවුල් 09 සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සුදුසු තීරණයක් ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අංක 04-05 යෝජනා සාකච්ඡා කිරීම සඳහා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ගරු සභාව කාරක සභාවක් බවට පත් කිරීමට යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

මෙම ඉඩම් සම්බන්ධයෙන් ලේකම්තුමා කරුණු පැහැදිලි කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසා සිටියේ ඉඩම් පවරා දීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට නීතිමය හැකියාවක් නොමැති බැවින් විධිමත් තක්සේරුවක් ලබා ගෙන වාර්ෂික බදු පදනම මත එම ඉඩම් කොටස් පදිංචිකරුවන්ට ලබා දීම සුදුසු බවයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් කාරක සභාව ගරු සභාව බවට පත් කිරීමට යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා ස්තිර කරන ලදි.

**<u>තීරණ අංක 04</u>**

ඉඩම් පවරා දීම සම්බන්ධයෙන් ප්‍රාදේශිය සභාවට නීතිමය හැකියාවක් නොමැති බැවින් මෙම ඉඩම් කොටස් වල තක්සේරුවක් ලබා ගෙන වාර්ෂික බලපත්‍රයක් ලබා දීම සම්න්ධයෙන් ඇති හැකියාව පිළිබඳ ගරු ආණ්ඩුකාරතුමියගෙන් උපදෙස් පැතීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

05. කෙටේතැන්න ගල්උළුවස්සාහේන ඉඩමෙහි අනවසර පදිංචි පවුල් 07 සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සුදුසු තීරණයක් ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 05**

ඉඩම් පවරා දීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට නීතිමය හැකියාවක් නොමැති බැවින් මෙම ඉඩම් කොටස් වල තක්සේරුවක් ලබා ගෙන වාර්ෂික බලපත්‍රයක් ලබා දීම සම්න්ධයෙන් ඇති හැකියාව පිළිබඳ ගරු ආණ්ඩුකාරතුමියගෙන් උපදෙස් පැතීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

06.පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව තුල සේවා ගරාජයක් ආරම්භ කිරීම සඳහා කාර්මික හා සේවා කමිටුවෙන් ලද යෝජනාව සුදුසු තීරණයක් ලබා ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.ඒ.ඉසුරු සම්පත් අලගියවන්න මැතිතුමා පවසා සිටියේ මේ සඳහා සේවා නිලධාරියෙක්, පුහුණු සේවකයින් ගැනීමට සිදුවෙනවා,අදාළ උපකරණ ගැනීමට සිදුවනවන හෙයින් මෙම කටයුතු සපුරගෙන 2026 වර්ෂයේදී මෙම ආයතනය තුල සේවා ගරාජයක් ආරම්භ කිරීමටත්,2027 වර්ෂය වන විට පුළුල් කර ආයතනයෙන් පිටතට රැගෙන යාමටත රාජ්‍ය ආයතන වල සියලුම වාහන අලුත්වැඩියා කිරීමටත් පසුව සේවා ලබා ගැනීමට පෞද්ගලික වාහන වලට අවස්ථාව ලබා දීම තුලින් ආයතනයට ආදායමක් ලබා ගත හැකි බවයි.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසා සිටියේ මෙම කාර්යය ක්‍රියාත්මක කරන වැඩපිළිවෙල වැදගත් බවත් මෙයින් සභාවේ වාහන අලුත්වැඩියාව වෙනුවෙන් යන වියදම අවම කර ගත හැකි බවත්,වාහන හොඳ තත්වයෙන් පවත්වා ගෙන යා හැකි බවයි.කඩිනමින් සේවා ගරාජයක් ආරම්භ කිරීම සුදුසු බවයි.

**තීරණ අංක 06**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට පෙර ආයතනයක් වශයෙන් මෙම කාර්යය කිරීමේදී නීතිමය තත්වය පිළිබඳ සොයා බැලීමටත්,මේ සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්ති කුමානකාරයකින් ක්‍රියාත්මක වනවාද යන්නත්,සේවකයින් බඳවා ගැනීම,අයතනයට අවශ්‍ය කරන සම්පත් සපයා ගැනීම,සේවාවල ගුණාත්මකභාවය අධීක්ෂණය ,රජයේ රෙගුලාසි වලට අදාළ බව, සභාවේ අරමුදළින් ආරම්භයේදී කෙතරම් වැයක් දැරීමට සිදුවනවාද යන්නත්,ආරම්භක ප්‍රාග්ධනය සපයා ගැනීමේදී රජයෙන් හෝ පළාත් සභාව මේ සඳහා මැදිහත් වීමක් දරනවාද යන්න සොයා බැලීමට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.පුෂ්පකුමාර ධනසේකර මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඒ.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.ඒ.ඉසුරු සම්පත් අලගියවන්න මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්.මොහාන් මංජුල මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී වී.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමාගෙන් සමන්විත කමිටුවක් පත් කිරීමටත්,මෙහි ප්‍රගතිය පිළබඳ වාර්තාවක් මාස 03ක් ඇතුළත ලබා දීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**07.**2026 වර්ෂය සඳහා ආදායම් පැනවීම සම්බන්ධ යෝජනා සභාවට ඉදිරිපත් කිරීම.

i. **2026 වර්ෂයට වරිපනම් බදු පැනවීමේ යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල දියුණු ගම් වශයෙන් ප්‍රකාශිත ප්‍රදේශ පිහිටි සියළුම නිවාසවල ,ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල 2024 වර්ෂයේ තක්සේරු කරන ලද වටිනාකම 2026 වර්ෂය සඳහා පිළිගැනීමටත්, ඒකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ උප වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර ඉහත කී වාර්ෂික වටිනාකමෙන්

01. පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල බල ප්‍රදේශයේ දියුණු ගම් වශයෙන් ප්‍රකාශිත ප්‍රදේශවල පිහිටි සෑම නිශ්චල දේපලක් මත සීයයට හයක (6%) වරිපනමක් ද,

02. පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මාරපන උප කාර්යාල ප්‍රදේශයේ දියුණු ගම් වශයෙන් ප්‍රකාශිත ප්‍රදේශවල පිහිටි සෑම නිශ්චල දේපලක් මත සියයට හතරක් (4%) වරිපනමක් 2023 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්,

ඒ වරිපනම්, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උප වගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31 - ජුනි 30 - සැප්තැම්බර් 30 - දෙසැම්බර් 31 යන දිනයන්ගෙන් අවසන් වන කාර්තු හතර තුළදී සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කිරීමටත් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 07 - i**
2026 වර්ෂයට වරිපනම් බදු පැනවීමේ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

ii. **2026 වර්ෂයට අක්කර බදු පැනවීමේ යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (3) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වු ද, ඉහත කී පනතේ 135 වන වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වු ද , ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වු,

(අ) හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන්ම, එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක් ම මත 2026 වර්ෂය සඳහා රු.10.00 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්

(ආ) ඉහත කී පනතේ 134 වන වගන්තියේ (3) වන උපවගන්තියේ අතුරු විධාන යටතේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික

සමාජවාදි ජනරජයේ IV (අ) වන කොටසේ 1989.02.03 වන දිනැති ගැසට් පත්‍රය ප්‍රකාශයට පත් කර ඇති හෙයින්, හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩු වූ සෑම ඉඩමක් මත, 2026 වර්ෂය සඳහා රු. 50.00 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට, සහ

(ඇ) ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (06) වන උප වගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31 , ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දින වලට පෙර සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කළ යුතු යයි ද යෝජනා කරන්නීය.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 07 - ii</u>**
2026 වර්ෂයට අක්කර බදු පැනවීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**iii. 2026 වර්ෂයට කර්මාන්ත බදු පැනවීමේ යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ II වන තීරුවේ, ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2026 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**උප ලේඛනය**

| I වන තීරුව | | IIවන තීරුව | | |
|---|---|---|---|---|
| අනු අංකය | කර්මාන්ත බදු | පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම රුපියල් | | |
| | | 750 නොඉක්මවන අවස්ථාවක | 750 ඉක්මවන එහෙත් 1500 නොඉක්මවන අවස්ථාවක | 1500 ඉක්මවන අවස්ථාවක |
| 01 | ස්වර්ණාභරණ නිපදවීම හෝ විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 02 | වාස්තු කර්මාන්තය | 500.00 | 750.00 | 1000.00 |
| 03 | විසිතුරු භාණ්ඩ නිපදවීම හා විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 04 | කුළු බඩු / කසායබඩු / බෙහෙත් ද්‍රව්‍ය පැකට් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 05 | පිංතූර රාමු කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 06 | මැටි භාණ්ඩ නිපදවීම හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 07 | කෘතිම මල් නිෂ්පාදනය හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 08 | රූපවාහිනී ඇන්ටනා නිෂ්පාදනය හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 09 | ධාන්‍ය ඇට පැකට් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 10 | තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 11 | ලියුම් කවර හෝවෙනත් කවර නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 12 | මෙට්ට නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 13 | හඳුන්කූරු නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 14 | බෑග්වර්ග මැසීම හා විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 15 | ඔරලෝසු අළුත් වැඩියාව | 500.00 | 750.00 | 1000.00 |
| 16 | පිත්තල භාණ්ඩ නිපදවීම හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 17 | ඇඳුම් මැසීම | 500.00 | 750.00 | 1000.00 |
| 18 | ස්ටිකර් කැපීම / දැන්වීම් / නාමපුවරු සැකසීම | 500.00 | 750.00 | 1000.00 |
| 19 | යතුරු කැපීම / සීල් කැපීම | 500.00 | 750.00 | 1000.00 |

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 07 - iii</u>**
2026 වර්ෂයට කර්මාන්ත බදු පැනවීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**iv. 2026 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීමේ යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2026 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන් ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I වන තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත

අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අයකිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තෙකුම එකී ව්‍යාපාර බද්ද 2026 වර්ෂයේ මාර්තු මස 31 වන දිනට පෙර පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**උපලේඛනය**

| I වන තීරුව | II වන තීරුව |
|---|---|
| බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයේ ලත් ලැබීම් ප්‍රමාණය | ගෙවිය යුතු බද්ද රු. ශත |
| 1. රු. 6,000 නොඉක්මවන අවස්ථාවක | නැත |
| 2. රු. 6,000 ඉක්මවන නමුත් 12,000 නොඉක්මවනවිට | 90.00 |
| 3. රු. 12,000 ඉක්මවනනමුත් 18,750 නොඉක්මවනවිට | 180.00 |
| 4. රු. 18,750 ඉක්මවනනමුත් 75,000 නොඉක්මවනවිට | 360.00 |
| 5. රු. 75,000 ඉක්මවනනමුත් 150,000 නොඉක්මවනවිට | 1,200.00 |
| 6. රු. 150,000 ඉක්මවනවිට | 3,000.00 |

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 07- iv</u>**

2026 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**v.කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථාව යටතේ 2026 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීමේ යෝජනාව.**

ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් 2026 වර්ෂය තුළදී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන්, 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමඟ කියවිය යුතු 149 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ 1 වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ ii වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමට පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

තවද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරණ සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පළක් වන විටදී, ඊට අදාළ බලපත්‍ර ලබා දීමේදී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2025 වර්ෂයේ ලැබීම්වලින් 1% ක් බලපත්‍ර ගාස්තුව ලෙස 2026 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් සභාව යෝජනා කරන්නීය.

**අංක 01 උප ලේඛනය - අන්තරාදායක ව්‍යාපාර**

| I වන තීරුව | | II වන තීරුව | | |
|---|---|---|---|---|
| | | ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල් | | |
| අනු අංකය | කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය | 750 නොඉක්මවන අවස්ථාවක | 750 ඉක්මවන එහෙත් 1500 නොඉක්මවන අවස්ථාවක | 1500 ඉක්මවන අවස්ථාවක |
| 01 | වඩු කර්මාන්තය | 500.00 | 750.00 | 1000.00 |
| 02 | ගෘහ භාණ්ඩ නිපදවීම හෝ විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 03 | ගඩොල් හෝ උළු නිපදවීම හෝ විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 04 | පාවහන් අළුත් වැඩියාව හා නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 05 | බ්ලොක් ගල් නිපදවීම හා විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 06 | ඉන්ධන පිරවුම්හලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 07 | ග්‍රිල් වැඩපලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 08 | සිමෙන්ති භාණ්ඩ නිපදවීම /විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 09 | පත්තර රැස්කිරීම හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 10 | මුද්‍රණාලයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 11 | තේ කර්මාන්ත ශාලා | 500.00 | 750.00 | 1000.00 |
| 12 | ගල් වැඩපලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 13 | ගල් මෝලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

**අංක 02 උප ලේඛනය - අප්‍රසන්න ව්‍යාපාර**

| I වන තීරුව | | II වන තීරුව | | |
|---|---|---|---|---|
| අනු අංකය | කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය | ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල් | | |
| | | 750 නොඉක්මවන අවස්ථාවක | 750 ඉක්මවන එහෙත් 1500 නොඉක්මවන අවස්ථාවක | 1500 ඉක්මවන අවස්ථාවක |
| 01 | සත්ව ආහාර අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 02 | ආයුර්වේද බෙහෙත් ද්‍රව්‍ය විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 03 | කෘතිම පොහොර අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 04 | පැණි,හකුරු නිපදවීම හා විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 05 | අයිස්ක්‍රීම් / අයිස්පැකට් / යෝගට් විකිණීම | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 06 | රබර් මිලට ගැනීම හා විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 07 | රා එකතු කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 08 | කුරුඳු මිලට ගන්නා ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 09 | කූල්ස්පොට් එකක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 10 | නූඩ්ලස් /ඉදිආප්ප / ක්ෂණික ආහාර නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 11 | මෝටර් සයිකල් අළුත්වැඩියාව | 500.00 | 750.00 | 1000.00 |
| 12 | ශීත කල මස් මාළු විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 13 | එළවළු වෙළඳාම | 500.00 | 750.00 | 1000.00 |
| 14 | පළතුරු වෙළඳාම | 500.00 | 750.00 | 1000.00 |
| 15 | සත්ව ආහාර නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 16 | සංචාරක වෙළඳාම | 500.00 | 750.00 | 1000.00 |
| 17 | තේ කුඩු විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 18 | මස් පිණිස සත්ව ඝාතන මඩුවක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 19 | භෝජනාගාරයක් / බත්කඩයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 20 | ආපන ශාලාවක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 21 | තේ හෝ කෝපි කඩයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 22 | එළකිරි එකතු කිරීමේ හෝ වෙළඳාම් ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 23 | මාළු විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 24 | මස් විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 25 | කේක් වර්ග අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 26 | කිරි පට්ටියක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 27 | ගව ගාලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 28 | සත්ව ගොවිපලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

**අංක 03 උප ලේඛනය - අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර**

| I වන තීරුව | | II වන තීරුව | | |
|---|---|---|---|---|
| | | ස්ථානයේ වාර්ෂිකව වටිනාකම රුපියල් | | |
| අනු අංකය | කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය | 750 නොඉක්මවන අවස්ථාවක | 750 ඉක්මවන එහෙත් 1500 නොඉක්මවන අවස්ථාවක | 1500 ඉක්මවන අවස්ථාවක |
| 01 | වැල්ඩින් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 02 | හුණු පිලිස්සීම | 500.00 | 750.00 | 1000.00 |
| 03 | ගොඩනැඟිලි ද්‍රව්‍ය විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 04 | මැණික් කැපීම හා ඔප දැමීම | 500.00 | 750.00 | 1000.00 |
| 05 | කෘෂි රසායනික ද්‍රව්‍ය ගබඩා කිරීම හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 06 | ගල් ස්මාරක හෝ ගලින් කරන ලද භාණ්ඩ අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 07 | යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 08 | හුණු පෝරණුවක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 09 | ලෝහ තහඩුවලින් භාණ්ඩ නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 10 | විදුලි උපකරණ අළුත් වැඩියාව | 500.00 | 750.00 | 1000.00 |
| 11 | ලියවන පට්ටල් වැඩපලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 12 | පැරණි යකඩ බඩු මිලට ගැනීම හා විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 13 | බැටරි චාර්ජ් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 14 | ග්‍රොසරියක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 15 | රසකැවිලි නිපදවීම / අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 16 | ඉංග්‍රීසි බෙහෙත් ශාලා | 500.00 | 750.00 | 1000.00 |
| 17 | ආයුර්වේද බෙහෙත් ශාලා | 500.00 | 750.00 | 1000.00 |
| 18 | මෝටර් රථ අළුත් වැඩියාව | 500.00 | 750.00 | 1000.00 |
| 19 | ත්‍රිරෝද රථ අළුත් වැඩියාව | 500.00 | 750.00 | 1000.00 |
| 20 | රබර් කර්මාන්ත ශාලා | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 21 | අයිස්ක්‍රීම් / අයිස්පැකට් / යෝගට් නිෂ්පාදන ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 22 | සිසිල් බීම නිෂ්පාදන ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 23 | නවාතැන් ගන්නා ස්ථානයක් / තානායමක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 24 | හෝටලයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 25 | බේකරියක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 26 | බාබර් සාප්පුවක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 27 | වාහන සේවා ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 28 | ලොන්ඩරියක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 29 | වී මෝලක් / ඇඹරුම්හලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 30 | ලුහු කර්මාන්තය (කම්මල් කර්මාන්තය) | 500.00 | 750.00 | 1000.00 |
| 31 | වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 07 – v</u>**
කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථාව යටතේ 2026 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

### vi. 2026 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීමේ යෝජනාව

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය සහ 4 වන උප ලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2026 වර්ෂයේ දී පහත උපලේඛනයේ i වන තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකු මත ම, එහි ii වන තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අය කිරීමට පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**උපලේඛනය**

**රු. ශත**

- මෝටර් රථයක්, මෝටර් කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා කාර්තුවකට 25.00

- සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල්, කාරයක් හෝ කරත්තයක් සඳහා :-

  (අ)වෙළඳ කාර්යය සඳහා යොදවන්නේ නම් 18.00

  (ආ)වෙළඳ කාර්ය නොවන කාර්ය සඳහා යොදවන්නේ නම් 4.00

- සෑම කරත්තයක් සඳහා 10.00
- සෑම අත්කරත්තයක් සඳහා 10.00
- සෑම රික්ෂෝවක් සඳහා 7.50
- සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා 15.00
- සෑම ඇතකු සඳහා 50.00

විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

මේ උපලේඛනයේ " වෙළඳ කාර්ය" යන්නට, විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 07- vi</u>**
2026 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

### vii. 2026 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු අයකිරීමේ යෝජනාව.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශීය බල සීමාව තුල කිනම් ආකාරයට හෝ පෙනෙන පරිදි ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තුවක් 2026 ජනවාරි මස 01 දින සිට අයකල යුතු යැයි පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නිය.

**උප ලේඛනය**

| | | රු.ශත |
|---|---|---|
| 01. | බිත්තියක හා පුවරුවක සඳහා ප්‍රදර්ශනය කරනු ලබන ස්ථිර ප්‍රචාරක දැන්වීම් සඳහා සෑම ව.අ. 01 කට - වර්ෂයකට | 150.00 |
| 02. | ඩිජිටල් දැන්වීම් පුවරු සඳහා ව.අ. එකකට | 300.00 |
| 03. | බැනරයක් හෝ කටවුට් මගින් ප්‍රදර්ශනය කිරීම | |
| | මාසයක කාලයක් සඳහා ව.අ. 01 කට | 75.00 |
| | මාස 03 ක කාලයක් සඳහා ව.අ. 01 කට | 100.00 |
| | මාස 03 කට වැඩි කාලයක් සඳහා ව.අ. 01 කට | 150.00 |

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 07 - vii</u>**
2026 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු අයකිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**viii .2026 වර්ෂය සඳහා සතිපොළ බදු අයකිරීමේ යෝජනාව.**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 119 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් ආකාරයට පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි සතිපොළෙහි 2026 වර්ෂය වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් පරිදි බදු අය කිරීමට පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

| | **උපලේඛනය** | රු. ශත |
|---|---|---|
| 01. | සතිපොළ ගොඩනැගිල්ල ඇතුළත ස්ථිර කඩ කාමරයක් සඳහා | 250.00 |
| 02. | සතිපොළ භූමිය තුළ තාවකාලිකවෙළඳ ස්ථානයක් සඳහා | 200.00 |
| 03. | මාර්ගය දෙපස තාවකාලික වෙළඳ ස්ථාන සඳහා | 180.00 |
| 04. | වෙනත් සුළු වෙළඳුන් සඳහා (ජංගම වෑන් රථයක්/ත්‍රීරෝද රථයක් වැනි) | 150.00 |

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 07 - viii</u>**
2026 වර්ෂය සඳහා සතිපොළ බදු අයකිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ix. 2026 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු අය කිරීමේ යෝජනාව.**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153(1) (ආ) ඡේදය යටතේ වන“සමානුපාතය” වශයෙන් අදාළ ඉඩමේ ගොඩනැගිලිවලින් ආවරණය වූ බිම් ප්‍රමාණය සහ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර අනුපාතය 1:7 ක් වන සේ පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ ඇති සංවර්ධනය නොකළ ඉඩම් සඳහා එම ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් සියයට 2 ක් වන බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අය කිරීමට පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 07 – ix</u>**
2026 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු අය කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**x. 2026 වර්ෂය සඳහා සපයනු ලබන සේවාවන් හා ආකෘතිපත්‍ර වෙනුවෙන් ගාස්තු අය කිරීමේ යෝජනාව.**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් සපයනු ලබන යම් යම් සේවාවන් හෝ පහසුකම් වෙනුවෙන් ඒ සඳහා විශේෂ වූ ගාස්තුවක් 2026 වර්ෂය සඳහා පහත පරිදි අය කිරීමට පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

| | | |
|---|---|---|
| 1. | වරිපනම් නම් වෙනස් කිරීමේ පෝරම ගාස්තු | 1000.00 |
| 2. | වීථි රේඛා සහ ගොඩනැගිලි සීමා ගාස්තු | 1500.00 |
| 3. | වරිපනම් ගෙවන බවට සහතික නිකුත් කිරීම | 1000.00 |
| 4. | විදුලිය ලබා ගැනීම සඳහා සහතික නිකුත් කිරීම | 500.00 |
| 5. | ලේඛන වල පිටපත් නිකුත් කිරීම | 150.00 |
| 6. | වසර දෙකකට වඩා පැරණි ලේඛන සෙවීමට වර්ෂයකට | 100.00 |
| 7. | වරිපනම් නොගෙවන බවට සහතික නිකුත් කිරීම | 150.00 |
| 8. | අනතුරු දායක ගස් ඉවත් කිරීමේ පෝරම ගාස්තු | 1000.00 |
| 9. | ජල බවුසරය ලබා දීම (ලී.5000) දිනකට | 7500.00 |
| 10. | අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා ගාස්තු | 5000.00 |
| 11. | සභාව සතු භූමිය කුලියට දීම - එක් දිනකට | 7500.00 |
| 12. | ඉඩම් වෙන්දේසි, ප්‍රසිද්ධ රැගුම් සඳහා බලපත්‍ර ලබා දීම | 500.00 |
| 13. | ප්‍රවර්ධන වැඩසටහන් සඳහා අයදුම්පත් ගාස්තු | 25.00 |
| 14. | දැන්වීම්/බැනර්/කටවුට් ප්‍රදර්ශනය සඳහා අයදුම්පත්‍ර ගාස්තු | 25.00 |
| 15. | ජලය ලබා ගැනීමට මාර්ගය පළුදු කිරීම් පරීක්ෂා කිරීම සඳහා සේවා ගාස්තු | 1000.00 |

16. කොම්පෝසට් පොහොර අලෙවි කිරීමේ ගාස්තු 1Kg සඳහා 12.00
100Kg ප්‍රමාණය ඉක්මවූ විට 10.00

17. ගලි බවුසරය ලබා දීම (ලෝඩ් 1 ක් වෙනුවෙන්) ආයතනයක් සඳහා 2500.00
නිවසක් සඳහා 2000.00
අයදුම්පත් ගාස්තු 25.00
අවසාන බැහැරලීම සඳහා 1000.00
සේවක ගාස්තු 1500.00
ප්‍රවාහන ගාස්තුව 1 km ක් සඳහා රු. 200.00 බැගින්

මීට අමතරව ඉල්ලුම්කරු හට බැහැරලීම සඳහා ස්ථානයක් තිබේනම් අවසාන බැහැරලීම සඳහා අය කරනු ලබන රු. 1000/ක ගාස්තුවෙන් නිදහස් කරයි.

18. ආදාහනාගාර සේවා ගාස්තු - බල ප්‍රදේශය තුළ 12000.00
බල ප්‍රදේශයෙන් පිට 15000.00

19. ගොඩනැගිලි අයදුම්පතක් නිකුත් කිරීම (නා.සං.අධිකාරියට අයත් නොවන) 500.00
ගොඩනැගිලි අයදුම්පතක් නිකුත් කිරීම (නා.සං.අධිකාරියට අයත්වන) 1000.00

20. පුස්තකාල අයදුම්පත් ගාස්තු 10.00
පුස්තකාල සාමාජික ගාස්තු පාසල් ළමුන් සඳහා 50.00
සාමාජිකත්වය අළුත් කිරීම පාසල් ළමුන් සඳහා 15.00
පුස්තකාල සාමාජික ගාස්තු වැඩිහිටියන් සඳහා 100.00
සාමාජිකත්වය අළුත් කිරීම වැඩිහිටියන් සඳහා 30.00
පුස්තකාල දඩ මුදල් දිනකට 2.00

21.පරිසර බලපත්‍ර ස්ථාන පරීක්ෂණ ගාස්තු අය කිරීම මධ්‍යම පරිසර අධිකාරී පනත අනුව නියමිත ගාස්තු අය කරනු ලැබේ.

22.පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ භෞතික සැලසුම් කාර්යයන් සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශයට පත්කර ඇති නාගරික සංවර්ධන අධිකාරී ප්‍රදේශය තුළ භෞතික සැලසුම් කාර්යයන් සඳහා වන ගාස්තු අය කිරීමේදී 2021.07.08 වන දිනැති අංක 2235/54 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් ගාස්තු උපලේඛනයන්ට අනුකූලව සිදු කෙරේ.

23.GI-I හෝ GI-L හැඩයේ කොඩි කණුවක් කුලියට දීමේ
ගාස්තු දිනකට 30.00

24.කිරිදි ඇල්ල ප්‍රවේශ මාර්ගය භාවිතා කරමින් කිරිදි ඇල්ල නැරඹීම
සඳහා නිකුත් කරනු ලබන ප්‍රවේශ පත්‍ර එනම්,
දේශීය - වැඩිහිටි 100.00
ළමා 50.00
විදේශීය 1500.00

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 07 - x**</u>

2026 වර්ෂය සඳහා සපයනු ලබන සේවාවන් හා ආකෘතිපත්‍ර වෙනුවෙන් ගාස්තු අය කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**xi .2026 වර්ෂයට අදාලව භෞතික සැලසුම් කාර්යයන් සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කර ඇති නාගරික සංවර්ධන අධිකාරී ප්‍රදේශයෙන් පිටත ප්‍රදේශ වෙනුවෙන් ගාස්තු අය කිරීමේ යෝජනාව.**

2026 වර්ෂයට අදාළව භෞතික සැලසුම් කාර්යයන් සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කර ඇති අංක 2235/54-2021 ජූලි මස 08 වන බ්‍රහස්පතින්දා (2021.07.08) නිකුත් කරන ලද ගැසට් පත්‍රය හා නාගරික සංවර්ධන අධිකාරී ප්‍රදේශයෙන් පිටත ප්‍රදේශ වෙනුවෙන් අංක 2418/03-2025 ජනවාරි මස 06වන සඳුදා (2025.01.06) දින ප්‍රකාශයට පත් කර ඇති iv(අ) වැනි කොටස -පළාත් සභා නිවේදන අතුරු ව්‍යවස්ථාවට අනුව ගාස්තු අය කිරීම සිදු කරනු ලැබේ.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 07 - xi**</u>

2026 වර්ෂයට අදාලව භෞතික සැලසුම් කාර්යයන් සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කර ඇති නාගරික සංවර්ධන අධිකාරී ප්‍රදේශයෙන් පිටත ප්‍රදේශ වෙනුවෙන් ගාස්තු අය කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**xii .2026 වර්ෂය සඳහා කසළ ගාස්තු අය කිරීමේ යෝජනාව.**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 ix(ආ)යටතේ පනවා ගන්නා ලද අතුරු ව්‍යවස්ථාවට අනුව සම්මත කර ගත් අංක 2274-2022 අප්‍රේල් 01වන දින රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද අතුරු ව්‍යවස්ථාවට අනුව පහත සඳහන් පරිදී 2026 වර්ෂය සඳහා දිරන නොදිරන කසළ ගාස්තු අය කිරීම පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට යෝජනා කරන්නීය.

| දෛනිකව කසළ ලබා දෙන ප්‍රමාණය | මාසිකව අය කිරීමට නියමිත මුදල |
|---|---|
| 10-15kg | 1000.00 |
| 16-21kg | 3000.00 |
| 22-27kg | 5000.00 |
| 28-32kg | 7000.00 |
| 33-38kg | 10000.00 |
| 39-43kg | 12000.00 |
| 44-49kg | 15000.00 |
| 50-55kg | 18000.00 |
| 56-60kg | 20000.00 |
| 61-66kg | 22000.00 |
| 67kg සිට වැඩිවන 5 kg සඳහා | 2000.00 |

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 07 - xii</u>**
2026 වර්ෂය සඳහා කසළ ගාස්තු අය කිරීම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**xiii .2026 වර්ෂය සඳහා සතිපොළ අසල රථගාල වෙනුවෙන් ගාස්තු අය කිරීමේ යෝජනාව.**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් සාදා සම්මත කර ගත් අංක 1865 හා 2014 මැයි මස 30 වන දින රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද වාහන නවතා තැබීම සඳහා ස්ථාන ඇති කිරීම සහ වාහන වලින් ගාස්තු අය කිරීම පිලිබඳ අතුරු ව්‍යවස්ථාවේ 06වන වගන්තිය අනුව පහත සඳහන් ආකාරයට ගාස්තු සංශෝධනය කර 2026 ජනවාරි මස 01 වන දින සිට අය කළ යුතු යයි පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**උපලේඛනය**

1. පාසල් බස් රථයක් සඳහා - දිනකට රු 50.00
2. පාසල් වෑන් රථයක් සඳහා - දිනකට රු 40.00

| | පැයකට | පළමු පැයට වැඩි සෑම පැයක් සඳහාම |
|---|---|---|
| | රු.ශත | රු. ශත |
| මෝටර් සයිකල් | 10.00 | 10.00 |
| ත්‍රීවිල් රථ | 20.00 | 10.00 |
| කාර්/වෑන් | 30.00 | 10.00 |
| බස් රථ/ ලොරිරථ | 50.00 | 10.00 |

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මහතා පවසා සිටියේ මෙම ගාස්තු මේ ආකාරයට සයිකල් රු.20.00, ත්‍රීවිල් රථ රු.50.00,කාර්/වෑන් රු.60.00,බස් රථ/ලොරි රථ රු.100.00ක් ලෙසත් සංශෝධනය විය යුතු බවයි.

**<u>තීරණ අංක 07 - xii</u>**
**ඒ අනුව ,**

| | පැයකට | පළමු පැයට වැඩි සෑම පැයක් සඳහාම |
|---|---|---|
| | රු.ශත | රු. ශත |
| මෝටර් සයිකල් | 20.00 | 10.00 |
| ත්‍රීවිල් රථ | 50.00 | 10.00 |
| කාර්/වෑන් | 60.00 | 10.00 |
| බස් රථ/ ලොරිරථ | 100.00 | 10.00 |

**2026 වර්ෂය සඳහා සතිපොළ අසල රථගාල වෙනුවෙන් ගාස්තු ඉහත ආකාරයට අය කිරීම** යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

08.GIS මඟින් සිතියම්ගත කළ මාර්ග 418ක් 2025.03.14 දින අංක 2427/33 දරන ගැසට් පත්‍රයෙහි පළ කර ඇත.මේ වන විට සිතියම්ගත කර ඇති සිතියම් 513ක් රජයේ මුද්‍රණාලය වෙත ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්.ඉන්දික ගයාන් මැතිතුමා පවසා සිටියේ මෙම ලේඛනයේ සඳහන් මාර්ග වල නම් සංශෝධනය විය යුතු බවයි.

මෙම කාරණය සාකච්ඡා කිරීම සඳහා මහ සභාව කාරක සභාවක් බවට පත් කළ යුතු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීෙ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදී මේ පිළිබඳ පැහැදිලි කිරීමක් ලේකම්තුමා හා විෂය නිලධාරී විසින් සිදු කරන ලදි.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසා සිටියේ මාර්ග වලට පුද්ගල නාම යොදා ඇති බැවින් එම නම් වෙනස් කළ යුතු බවයි.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා පවසා සිටියේ මාර්ග ගැසට් කිරීමෙන් පසු මෙය ප්‍රාදේශීය සභාව සතු පාරක් යනුවෙන් නාම පුවරුවක් සවි කිරීම සුදුසු බවයි.

කාරක සභාව මහ සභාවක් බවට පත් කළ යුතු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

<u>**තීරණ අංක 08**</u>

මාර්ග නම් වල ඇති සංශෝධන කටයුතු සිදු කිරීමෙන් පසුව මාර්ග 513 රජයේ මුද්‍රණාලය වෙත ගැසට් පත්‍රෙය් පළ කිරීමටත්,ඇතුලත් වී නොමැති මාර්ග නැවත මැනුම් කටයුතු සිදු කිරීමත් සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

09. ජාතික තරුණ සේවා සභාව,ගොඩගම,පැල්මඩුල්ල පුහුණු මධ්‍යස්ථානයේ කාර්මික (NVQ 4) පරිගණක පාඨමාලාව හදාරා අවසන් කර ඇති දෙමුවාත,රක්වාන ලිපිනයෙහි පදිංචි කේ.එම් හසිනි ප්‍රමෝදා මෙය වෙත අප ආයතනයේ මාස 06ක පරිගණක ක්ෂේත්‍රයේ වැඩිදුර පුහුණු අවස්ථාවක් ලබාගැනිම සඳහා කරනු ලබන ඉල්ලීම හා රාජ්‍ය පරිපාලන චක්‍රෙල්ඛ 04/2017(II) ප්‍රකාරව දිනකට රු.1000.00ක මුදලක් ගෙවීමටත් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 09**</u>

දෙමුවාත,රක්වාන ලිපිනයෙහි පදිංචි කේ.එම් හසිනි ප්‍රමෝදා මෙය වෙත අප ආයතනයේ මාස 06ක පරිගණක ක්ෂේත්‍රයේ වැඩිපුර පුහුණු අවස්ථාවක් ලබා දීම රාජ්‍ය පරිපාලන චක්‍රෙල්ඛ 04/2017(II) ප්‍රකාරව දිනකට රු.1000.00ක මුදලක් ගෙවීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

<u>**II.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමාගේ යෝජනා.**</u>

01.බෝපැත්ත ග්‍රාම නිලධාරී වසමේ බෝපැත්ත මංසන්දිය අසළ ආරම්භක ස්ථානයේ කාණුව කොන්ක්‍රීට් කර පිළිසකර කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා පවසා සිටියේ බෝපැත්ත හන්දියේ මාර්ගය මැනුම් සිදු කළත්,එහි කාණු සකස් කිරීමේදී බෝපැත්ත හන්දියේ පහලට යන මාර්ගයේ පටු ස්ථානයේ කානුවක් සෑදුවත් වැසි කාලයේදී එම ස්ථානයෙන් සියලුම වතුර පාරවල් මෙම කාණුව හරහා යන හෙයින් මෙම පටු මාර්භය කැඩී යන බවයි.

<u>**තීරණ අංක 10**</u>

කාර්මික නිලධාරී මඟින් ස්ථානීය පරීක්ෂණයක් සිදු කිරීමෙන් පසු ලැබෙන නිර්දේශ මත සහා වියදමින් දැරීමට හැකි සංවර්ධනයක් නම් සිදු කිරීමටත්,එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතන වලට යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

<u>**III.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී එච්.ඥානලතා හපුතන්ත්‍රි මැතිතුමියගේ යෝජනා**</u>

01.හෙට්ටිකන්ද පාසල අසළ සිට නාරංගොඩ උඩකොටස ගම්මානයට දිවෙන “රිංගානා ඇළ”අසළ අබළංව පවතින ගමනාගමනයට ඉතා අපහසු තත්වයක පවතින වර්ෂා කාලයට මෙම මාර්ගයේ කිසිසේත්ම යාමට නොහැක.එය සාදා නිම කිරීම සඳහා විෂ්කම්භය අඩි 2ක් හා දිග අඩි 4ක් වන හියුම් පයිප්ප 03ක් යොදා පාර ගල් අතුරා කොන්ක්‍රීට් කර ආරක්ෂිත වැට සකසා දෙන මෙන් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 11**</u>

කාර්මික නිලධාරී මඟින් ස්ථානීය පරීක්ෂණයක් සිදු කිරීමෙන් පසු ලැබෙන නිර්දේශ මත සහා වියදමින් දැරීමට හැකි සංවර්ධනයක් නම් සිදු කිරීමටත්,එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතන වලට යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

02.නාරංගොඩ අමුණ අසළ දිලෙන තරු ක්‍රීඩා සමාජයේ තරුණ තරුණියන් ක්‍රීඩා කරන ක්‍රීඩා පිටියට විදුලි ආලෝකය නොමැති බවත්,ඔවුන්ට වොලිබෝලයක අවශ්‍යතාවයද ඇති බව දන්වා ඇති හෙයින් ඔවුන්ගේ මෙම අවශ්‍යතාවයන් ඉටු කර දෙන ලෙසට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා පවසා සිටියේ වීදි පහන් ලබා දිමේදී කොට්ඨාශ 37 ට සමානව බල්බ් 03ක් වත් මන්ත්‍රීවරුන්ට ලබා දෙන ලෙසත් එවිට මන්ත්‍රීවරුන්ට අවශ්‍ය ස්ථාන වල( එනම් අලුත්වැඩියා කළ යුතු තත්වයේ පවතින ස්ථාන වල)බල්බ් යෙදීමට හැකියාවක් ලබා දීමට හැකි නම් හා කිසියම් ප්‍රතිපාදනයක් ලබා දීමට හැකි නම් මන්ත්‍රීවරුන්ගේ අනන්‍යතාවය ආරක්ෂා වන බවයි.

**තීරණ අංක 12**

ප්‍රතිපාදන තත්වය සළකා බලා මෙම කාර්යය සිදු කිරීමටත් එසේ එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතන වලට යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

03.කිරිවත්දල ගමේ සිංහල-දමිළ ජනතාව සඳහා බලපා ඇති පානීය ජල ප්‍රශ්නය නිසා ඉතා අසරණව ඇත.ජල මූලාශ්‍ර ඇතත් ඉහළ කුට්ටපිටියේ සිට කිරිවත්දල දක්වා ප්‍රජා ජලය ලබා දුන්නත් දැනට එය අක්‍රීයව පවතී.ඒ හේතුවෙන් මොවුන්ට පානීය ජලය නොමැති බව දන්වා සිටී.මේ පිළිබඳව අවධානය යොමු කරන ලෙසත්,මෙය ඉෂ්ඨ සිද්ධ කර දෙන මෙන් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 13**

කාර්මික නිළධාරී ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ මත මෙම කාර්යය සිදු කිරීම සඳහා අදාළ ආයතන වලට යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

04.ඉඩංගොඩ හෙල උඩ මාර්ගය කිරිවත්දල දක්වා දිවෙන මාර්ගය මීටර් 150ක් පමණ ගල් අතුරා කොන්ක්‍රීට් දැමීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 14**

කාර්මික නිලධාරී මඟින් ස්ථානීය පරීක්ෂණයක් සිදු කිරීමෙන් පසු ලැබෙන නිර්දේශ මත සහ වියදමින් දැරීමට හැකි සංවර්ධනයක් නම් සිදු කිරීමටත්,එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතන වලට යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

05.නාරංගොඩ නො.06 විහාර හංදියේ උඩ කොටස තිලකසිරි මහතාගේ නිවස දක්වා මීටර 300ක් පමණ ගල් අතුරා කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 15**

කාර්මික නිලධාරී මඟින් ස්ථානීය පරීක්ෂණයක් සිදු කිරීමෙන් පසු ලැබෙන නිර්දේශ මත සහ වියදමින් දැරීමට හැකි සංවර්ධනයක් නම් සිදු කිරීමටත්,එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතන වලට යොමු කිරීම සුදුසු බවටඒකමතිකව සභා සම්මත විය.

**IV.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එම්.සුලාරි සඳරේඛා මාකාවිට මැතිතුමියගේ යෝජනා.**

01.අඩු ආදායම්ලාභී ස්ථිර රැකියාවක් නොමැති කුට්ටපිටිය ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ ජීවත් වන තුසිත ජයවික්‍රම යන අයට වැසිකිළියක් සාදා දෙන ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 16**

කාර්මික නිලධාරී මඟින් ස්ථානීය පරීක්ෂණයක් සිදු කර වාර්තාවක් ලබා ගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

02.විද්‍යාල මාවත මාර්ගයේ ඇති වලවල් පැච් දමා වැසීමට අදාළ අංශ දැනුවත් කර දෙන ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 17**

කාර්මික නිලධාරී මඟින් ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ මත මෙම කාර්යය සිදු කිරීම සඳහා අදාළ ආයතන වෙත යොමු කිරීම සුදුසු බවටඒකමතිකව සභා සම්මත විය.

**V.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ශාන්ත පුෂ්පකුමාර කුඩාවත්ත මැතිතුමාගේ යෝජනා.**

01.සකිකන්ද ප්‍රධාන මාර්ගයේ ටී.නිමල් මහතාගේ නිවස ආසන්නයේ ඇති බෝක්කුව පුළුල් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජීජ්.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 18**</u>

කාර්මික නිලධාරී මඟින් ස්ථානීය පරීක්ෂණයක් සිදු කිරීමෙන් පසු ලැබෙන නිර්දේශ මත සහා වියදමින් දැරීමට හැකි සංවර්ධනයක් නම් සිදු කිරීමටත්,එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතන වලට යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

02.වලව්වත්ත පිවිසුම් මාර්ගයේ දොළට බෝක්කුවක් ඉදිකිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 19**</u>

කාර්මික නිලධාරී මඟින් ස්ථානීය පරීක්ෂණයක් සිදු කිරීමෙන් පසු ලැබෙන නිර්දේශ මත සහා වියදමින් දැරීමට හැකි සංවර්ධනයක් නම් සිදු කිරීමටත්,එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතන වලට යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

03.තේ දළු ප්‍රවාහනය සඳහා විශේෂයෙන් භාවිතා වන කුට්ටපිටිය උඩතුල කොටසේ සිට දිවෙන සුදුවැලිගල මාර්ගය කඩිනමින් පිළිසකර කිරීමට යෝජනා කරමි.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ශාන්ත කුමාර කුඩාවත්ත මැතිතුමා පවසා සිටියේ මෙම මාර්ගය 1/2km පමණ ජනතාවගේ ශ්‍රම දායකත්වයෙන් මාර්ගය සකස් කරන අතර 1 km පමණ ගල් ලයිසන් කර ඇත්තේද ජනතාවගේ මුදල් වලිනි.මෙම මාර්ගය එදිනෙදා විශාළ දළු ප්‍රමාණයක් ප්‍රවාහනය වන බවත්,මාර්ගය කැඩී යාම නිසා දළු ප්‍රවාහනය කරන ලොරි රථ ගමන් නොකරන හෙයින් මෙම දළු ලොරි රථ වෙත ගෙන ඒමට සිදුවන බැවින් ජනතාව ගැටළුකාරී තත්වයකට පත් වී සිටී.මෙම මාර්ගය සකස් කර දෙන්නේ නම් ජනතාව ශ්‍රම දායකත්වය ලබා දෙන බවද පවසන ලදි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 20**</u>

කාර්මික නිලධාරී මඟින් ස්ථානීය පරීක්ෂණයක් සිදු කිරීමෙන් පසු ලැබෙන නිර්දේශ මත සහා වියදමින් දැරීමට හැකි සංවර්ධනයක් නම් සිදු කිරීමටත්,එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතන වලට යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**VI.<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එල්.යුරේෂ් පුෂ්පකුමාර මැතිතුමාගේ යෝජනා.</u>**

01.නාරංගොඩ වසමේ නාරංගොඩ හා දෙහිගහදෙණිය යා කරන මාර්ගයේ කුරුදු කැල්ල කොටසේ ඇති ඇළ මාර්ගය හරහා සිලින්ඩර යොදා එම ස්ථානය කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 21**</u>

කාර්මික නිලධාරී මඟින් ස්ථානීය පරීක්ෂණයක් සිදු කිරීමෙන් පසු ලැබෙන නිර්දේශ මත සහා වියදමින් දැරීමට හැකි සංවර්ධනයක් නම් සිදු කිරීමටත්,එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතන වලට යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

02.කුට්ටපිටිය වසමේ නො.06කොටසේ පහළ හරස් මාර්ගයේ වතුර බසිනා ස්ථානයට සිලින්ඩරයක් යෙදීමට යෝජනා කරමි.(ලක්ෂයක් පමණ)

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 22**</u>

කාර්මික නිලධාරී මඟින් ස්ථානීය පරීක්ෂණයක් සිදු කිරීමෙන් පසු ලැබෙන නිර්දේශ මත සහා වියදමින් දැරීමට හැකි සංවර්ධනයක් නම් සිදු කිරීමටත්,එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතන වලට යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

03.කුට්ටපිටිය වසමේ වත්තෙ පංගුව වටවළ මාර්ගයේ යාවන අඩි 30ක පමණ පාලමේ ආරක්ෂක වැට ඉදි කිරීමට යෝජනා කරමි.(150,000.00 පමණ)

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 23**</u>

කාර්මික නිලධාරී මඟින් ස්ථානීය පරීක්ෂණයක් සිදු කිරීමෙන් පසු ලැබෙන නිර්දේශ මත සහා වියදමින් දැරීමට හැකි සංවර්ධනයක් නම් සිදු කිරීමටත්,එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතන වලට යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

04.සෑම මන්ත්‍රීවරයෙක් හෝ වරියකට ප්‍රාදේශිය සභාවේ ප්‍රතිපාදන වලින් රු.50,000.00ක මුදලක් ගම තුල තිබෙන සුළු පරිමාණ ව්‍යාපෘති කිරීමට වෙන් කර දෙන මෙන් යෝජනා කරමි.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එල්.යුරේෂ් පුෂ්පකුමාර මැතිතුමා පවසා සිටියේ සමිතියකට වොලිබෝලයක් ඇරන් දීමට,කළ හැකි සංවර්ධනයන් සිදු කිරීමට රු.50,000.00ක මුදලක් ලබා දීමට හැකිනම් හොඳ බවයි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 24**

ප්‍රාදේශීය සභා පනතට අනුව මුදල් වෙන් කිරීමේ හැකියාවක් නොමැති බවට ඒකමතිකව සභා සම්මත විය.

VII.**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී රාජරත්නම් පුවනේස්වරී මැතිතුමියගේ යෝජනා.**

01.දේවස්ථානයේ සිට වතු නිවස ඉදිරියෙහි පාරට යාබදව ඇති අඩි 15ක් පමණ උස ඉවුර පාංශු ඛාදනය වෙමින් පවතින නිසා මීටර් 200ක් පමණ දිග පැති බැම්මක් සකස් කර දෙන මෙන් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 25**

කාර්මික නිලධාරී මඟින් ස්ථානීය පරීක්ෂණයක් සිදු කිරීමෙන් පසු ලැබෙන නිර්දේශ මත සභා වියදමින් දැරීමට හැකි සංවර්ධනයක් නම් සිදු කිරීමටත්,එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතන වලට යොමු කිරීම සුදුසු බවටඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.පුවනේස්වරී මැතිතුමිය ප.ව.01.30ට සභාවෙන් පිටවන ලදි.

VIII.**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.සරත් උෂාන් මහානාම මැතිතුමාගේ යෝජනා.**

01.පහළ හකමුව සමූපකාරය අසළ තිබෙන කාණු පද්ධතිය සැකසීමට යෝජනා කරමි.

02. ජයරත්න කපිතාන් මාවතේ ආරම්භයේ සිට වේ ගහ දක්වා දිවෙන මාර්ගයේ කාණු පද්ධතිය සෑදීමට යෝජනා කරමි.

03.පේරලන්ද පාසල අසළ ප්‍රධාන මාර්ගය හරහා යොදා ඇති කාණු පද්ධතියේ ඇති බෝක්කුව අවහිර වී ඇති නිසා එය සාදා ගැනීමට යෝජනා කරමි.

**තීරණ අංක 26**

මෙම යෝජනා තුන ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.සරත් උෂාන් මහානාම මැතිතුමා විසින් ඉල්ලා අස් කර ගන්නා ලදි.

**IX.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමාගේ යෝජනා.**

01.ගල්ලෙපිට සුසාන භූමිය සුද්ධ කිරීමට සභාවේ තණකොළ කපන මැෂින් යොදා සුද්ධ කර ඉදිරිපසට බැම්මක් ඉදිකර සම්පූර්ණ භූමි ප්‍රදේශය අඩි දෙකක් පමණ පස් පිරවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.නිශාන්ත බුද්ධාරච්චි මහතා පවසා සිටියේ වැඩිම පිරිසක් භාවිතා කරන මේ සුසාන භූමිය වන හෙයින් මෙම සුසාන භූමියේ නාම පුවරුවක් සවි කිරීමටත්,අඩි 3ක් උස බැම්මක් ඉදි කර එය පිරවීම තුලින් නැවත මුළු භූමිය තුලම මිනී ආදාහනයට ඉඩකඩ ලැබෙන බවයි.

**තීරණ අංක 27**

කාර්මික නිලධාරී මඟින් ස්ථානීය පරීක්ෂණයක් සිදු කිරීමෙන් පසු ලැබෙන නිර්දේශ අනුව සභාවේ තණකොළ කපන මැෂින් යොදා සුද්ධ කිරීමටත්, සභා වියදමින් බැම්මක් ඉදිකර සම්පූර්ණ භූමි ප්‍රදේශය අඩි දෙකක් පමණ පස් පිරවීමට හැකියාවක් පවතී නම් සිදු කිරීම සුදුසු බවටඒකමතිකව සභා සම්මත විය.

02.ඉදිරි දිනවලදී සියළු විහාරස්ථාන ආශ්‍රිතව කඨින පිංකම් පැවැත්වීමට සංවිධානය කර ඇති බැවින් එම මාර්ගවල වීදි පහන් අලුත්වැඩියා කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 28**

වීදි පහන් මිලදී ගත් පසු එම මාර්ගවල වීදි පහන් අලුත්වැඩියා කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

හදිසි යෝජනා

**ගරු සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමාගේ යෝජනා**

01.ප්‍රධාන අමාත්‍යාංශ හා පළාත් පාලන මාර්ග අමාත්‍යාංශ මඟින් අංක 01-අංක 15 දක්වා ප්‍රතිපාදන වෙන් වී ඇති ව්‍යාපෘති

සඳහා ප්‍රතිපාදනය රු.ලක්ෂ 20ට අඩු ව්‍යාපෘතීන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව ප්‍රජා පාදක සංවිධානයක් තෝරා කොන්ත්‍රාත් පැවරීම අනුමැතිය සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 29</u>**

| අනු අං. | ව්‍යාපෘතියේ නම | අනුමත ප්‍රතිපාදන රු. |
|---|---|---|
| 01 | බුලත්වැල්ගොඩ මාර්ගය සංවර්ධනය කිරීම | 876598.34 |
| 02 | මිදලන දෙබුන්වල ගම්මානයට යන මාර්ගය සංවර්ධනය කිරීම | 1165894.46 |
| 03. | දේවාලෙගම සිංගප්පුලිකන්ද සංජීව මහතාගේ නිවස අසළ සිට දුම්මල ගස්තැන්න දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 1907311.64 |
| 04 | පාතකඩ බේකරිය උඩ පාර සංවර්ධනය කිරීම | 1103219.55 |
| 05 | වැලිමලුව පිටකුඹුර ග්‍රාමය හරහා ඇතුගල ආරණ්‍ය දක්වා අබලන් මාර්ගය අලුත්වැඩියා කිරීම | 1903386.57 |
| 06 | සේපාලිකා කඩය අසල සිට උඩ ලැයිම පිටුපසින් ඇති මාර්ගය සංවර්ධනය කිරීම | 1784202.02 |
| 07 | නීලගම වත්ත කට්ටංගෙ කහවත්ත පහළ කොටස සිට කට්ටංගෙ ඉහළ කොටස දක්වා මාර්ගය සංවර්ධනය කිරීම | 1459367.91 |
| 08 | කෙටේතැන්න කසළ කළමනාකරණ කාණු පද්ධතිය සංවර්ථනය කිරීම | 1330158.28 |
| 09 | පැල්මඩුල්ල කොම්පෝස්ට් අංගනයේ ප්‍රෙවිශ මාර්ගය සංවර්ධනය කිරීම | 1451888.27 |
| 10 | වටවල ඉමේකැලේ දක්වා මාර්ගය සංවර්ධනය කිරීම | 1460783.04 |
| 11 | සිංගප්පුලිකත්ද අමුණ මාර්ගයේ පාලම දෙපස සංවර්ධනය කිරීම | 1461176.99 |
| 12 | බණ්ඩාරනායකපුර ආයුර්වේද පහල පාරේදැනට කොන්ක්‍රීට් කර ඇති තැන සිට ඉදිරියට කොන්ක්‍රීට් කිරීම | 974011.67 |
| 13 | වැලිමලුව ගමට පිවිසෙන දොඩම්ගහ ඇල පාර මාර්ගය සංවර්ධනය කිරීම | 1903711.41 |
| 14 | පෙරෝණුව වත්තේ උඩ කොටසේ සනීපාරක්ෂක පහසුකම් (නව වැසිකිළි)වැඩි දියුණු කිරීම | 1139244.04 |
| 15 | රඹුක්කන්ද වත්ත හපුරුගල කොටසේ ළමා සංවර්ධන මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම | 847888.02 |

ප්‍රතිපාදනය රු.ලක්ෂ 20ට අඩු ව්‍යාපෘතීන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව ප්‍රජා පාදක සංවිධානයක් තෝරා කොන්ත්‍රාත් පැවරීම ඒකමතිකව සහා සම්මත විය.

02.අංක 01-06 දක්වා නම් සඳහන් සංවර්ධන ව්‍යාපෘති සඳහා ගිවිසුම් කාලය දීර්ඝ කර දීම සඳහා අනුමැතියට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 30</u>**

පහත සඳහන් ව්‍යාපෘති සඳහා ගිවිසුම් කාලය දීර්ඝ කර දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

| අනු අංකය | ව්‍යාපෘතිය |
|---|---|
| 01 | දේවාලේගම සිංගප්පුලිකන්ද සංජීව මහතාගේ නිවස අසල සිට දුම්ලගස්තැන්න දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීම |
| 02 | මිදලන දෙබුන්වල ගම්මානයට යන මාර්ගය සංවර්ධනය කිරීම |
| 03 | කෙටේතැන්න කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ කාණු පද්ධතිය සංවර්ධනය කිරීම |
| 04 | සිංප්පුලිකන්ද අමුණ මාර්ගයේ පාලම දෙපස සංවර්ධනය කිරීම |
| 05 | වටවල ඉමේකැලේ දක්වා මාර්ගය සංවර්ධනය කිරීම |
| 06 | බුලත්වැල්ගොඩ පාර සංවර්ධනය කිරීම |

03.2025 වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන් වන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රසම්පාදන කමිටුව ලෙස මහ සභාවෙන් අනුමත කෙරෙන ප්‍රසම්පාදන කමිටුවක් හා අංක 01-04 දක්වා නම් සඳහන් තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කිරීම සුදුසු බව යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 31</u>**

පහත සඳහන් 2025 වර්ෂයට ප්‍රසම්පාදන කමිටුව හා තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කිරීම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

**ප්‍රසම්පාදන කමිටුව-**

| | |
|---|---|
| ගරු සභාපති | -එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා |
| ලේකම් | -ආර්.කේ.කපිල ජගත් ගුණතිලක මයා |
| කාර්මික නිලධාරී | --එච්.ජයසිංහ මයා |
| සභිකයන් | -ගරු ඒ.එම්.ඒ.ඉසුරු සම්පත් අලගියවන්න මැතිතුමා |
| | -ගරු වී.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා |
| | -ගරු එම්.ඒ.පුෂ්පකුමාර ධනසේකර මැතිතුමා |
| | -ගරු බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා |
| | -ගරු කේ.ඩී.රුවන් චානක පියරත්න මැතිතුමා |
| | -ගරු.වී.ඉන්දික උදයකුමාර ගුණවර්ධන මැතිතුමා |

**තාක්ෂණික ඇගයීම් කමිටුව-**

| අනු අං කය | නම | තනතුර හා ආයතනය | කමිටුවේ තනතුර |
|---|---|---|---|
| 01 | ඩබ්.ඒ.ඩබ්.එල්.හේමාන්ත මහතා | පළාත් පාලන ඉංජිනේරු, පළාත් පාලන දෙපාර්තමේන්තුව - සබරගමුව පළාත් සභාව . | සභාපති |
| 02 | එම්.ඩී.එස්.ප්‍රනාන්දු මහතා | ප්‍රධාන ගණකාධිකාරී - පළාත් පාලන දෙපාර්තමේන්තුව - සබරගමුව පළාත් සභාව | කමිටු සාමාජික |
| 03 | එස්.එන්.කේ.පී.නාරායන මහතා | කාර්මිකBනිලධාරී - සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලය | කමිටු සාමාජික |
| 04 | බී.එම්.එස්.ඉරෝෂන් මහතා | කාර්මික නිලධාරී - ප්‍රාදේශීය සභාව, පැල්මඩුල්ල | කමිටු සාමාජික |

04.අංක 01-14 දක්වා නම් සඳහන් ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු සකස් කිරීම සම්බන්ධව අනුමැතිය සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 32</u>**

පහත සඳහන් ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු සකස් කිරීම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

| අනු අං කය | ව්‍යාපෘතියේ නම | දළ ඇස්තමේන්තුව රු.මි. |
|---|---|---|
| 01 | දොඹගස්වින්න සර්වෝදයට පිවිසෙන මාර්ගයේ සිට ඉදිරියට දොඹගස්වින්න පාසල අසල මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 2.00 |
| 02 | ප්‍රධාන මාර්ගයේ සිට (මාර්ෂල්වැලිවත්ත) දොන් සෙනවිරත්න මහතාගේ නිවස අසළ වංගුව දක්වා මාර්ගය දෙපස කාණු පද්ධතිය යොදා කාපට් කිරීම | 2.00 |
| 03 | බුලත්වැල්ගොඩ මාර්ගයේ දකුණු පසට ඇති නාලක මැණික් නිවාස දෙසට යන මාර්ගයේ ධර්මරක්ඛිත මහාතාගේ නිවස අසල සිට ගිලා බැස ඇති මාර්ගය දෙපස කාණු පද්ධතිය සහ මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 1.00 |
| 04 | බේකරිය උඩපාරට පිවිසුම් මාර්ගය කොන්ක්‍රීට් කිරීම මෙම මාර්ගය පළාත් පාලන මාර්ග සංරචකය යටතේ ප්‍රතිපාදන අනුමතව වැඩ අවසන් කර ඇත. එම නිසා මෙම යෝජනාව වෙනුවට පියදාස තෙන්නකෝන් මාවත පිවිසුම් කොටසෙහි පැති බැමි යෙදීම සහ කොන්ක්‍රීට් කිරීම යෝජනාව ඉදිරිපත් කරමි. | 2.00 |
| 05 | බණ්ඩාරවත්ත දෙනවක යා කරන මාර්ගයේ අරෝන්සින්ඥ මහතාගේ නිවස අසල සිට දෙනවක පාතකඩ දක්වා මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය | 1.5 |
| 06 | සන්නස්ගම වේවැල්දොළ අමුණ අසළ සිට හේන්යාය දක්වා දිවෙන මාර්ගය ඉතිරි කොටස සංවර්ධනය කිරීම හා පැති බැම්ම ඉදි කිරීම | |
| 07 | පොල්අත්තැන්න ග්‍රාමයට පිවිසුම් පාලම පුළුල් කොට සකස් කිරීම | 2.00 |
| 08 | කිරිවැල්දෙනිය පන්සල අසල සිට (250 M)ඉන් ඉදිරියට ගල් අතුරා තාර දැමීම | 1.5 |
| 09 | සමණල උයන ප්‍රදේශයට පිවිසුම් මාර්ගය තාර දැමීම සහ මාර්ගය පැති කාණු යොදා පිළිසකර කිරීම | 1.5 |
| 10 | බුදුලෙන ජයතිලක මහතාගේ වෙළඳසැල අසළ සිට සරත් මහතාගේ නිවස අසළ දක්වා කොන්ක්‍රීට් කිරීම | 2.00 |
| 11 | ධර්මරක්ඛිත මාවත අමුණ දක්වා මාර්ගයේ ඉතිරි කොටසේ මාර්ගය සංවර්ධනය කිරීම සහ ඇළ මාර්ගය සංවර්ධනය කිරීම | 1.00 |
| 12 | ඉහළ බෝපිටිය පාළුවත්ත මාර්ගය ඉදිරියට පිළිසකර කිරීම | 2.00 |
| 13 | උඩගංගොඩ මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 2.00 |
| 14 | දිප්පිටිගල ස්ටාලවත්ත මාර්ගයේ කොන්ක්‍රීට් කර නොමැති ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම හා පැති කාණුව ඉදි කිරීම | 1.00 |

05.අනියම් රියදුරු ඕ.වී.ජගත් මයාගේ සේවා ගිවිසුම් කාලය 2025.10.15 දිනෙන් අවසන් වන බැවින් එම කාල සීමාව වසරකින් දීර්ඝ කිරීම සුදුසු බව යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 33</u>**

ඕ.වී. ජගත් මයාගේ සේවා ගිවිසුම් කාලය 2025.10.15 සිට 2026.10.14 වන දින දක්වා වසරකින් දීර්ඝ කිරීම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමාගේ යෝජනා.</u>**

01.දේවාලෙගම කොට්ඨාශයේ සිංගප්පුලිකන්ද මාර්ගයේ බී.සමන්ත මහතාගේ නිවස අසළ මාර්ගය අඩි1.5ක පමන කොටසක් ගිලා බැසීමට ලක්ව ඇති බැවින් මාර්ගයේ ගමනාගමනය අඩාළවී ඇත.කඩිනමින් සංවර්ධනය කර දෙන ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඒ.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 34**

කාර්මික නිලධාරී මඟින් ස්ථානීය පරීක්ෂණයක් සිදු කිරීමෙන් පසු ලැබෙන නිර්දේශ මත සභා වියදමින් දැරීමට හැකි සංවර්ධනයක් නම් සිදු කිරීමටත්,එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතන වලට යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමාගේ යෝජනා.**

01.ඉන්ධන දීමනාව හා දුරකතන දීමනාව සම්බන්ධව සාකච්ඡාවක් කර ක්‍රමවේදයක් සළසා දෙන මෙන් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා පවසා සිටියේ ඉන්ධන දීමනාව හා දුරකතන දීමනාව පෙර පරිදී සභික දිමනාවට එකතු කර ලබා දෙන්නේ නම් සහනයක් බවයි.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසා සිටියේ රු.8000.00 දීමනාවක් අනුමත වී ඇතත්, මන්ත්‍රීවරුන්ට දෙන දීමනාව කොළ පිරවීමට සිදුවෙනවා නම් මම බලවත් අප්‍රසාදය මේ අවස්ථාවේදී පලකරන බවත්,මේ මඟින් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් හැල්ලුවකට පත් වීමක් සිදුවන බවත්,පෙර ලබා දුන්නා නම් ඇයි දෙන්න් බැරි මොකක්ද හේතුව සොයා බැලිය යුතු බවත්ය.

**තීරණ අංක 35**

2025.08.25 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත් අංක 2451/02 හි සඳහන් වන ආකාරයට රු.8000.00ක යටත්ව ගෙවනු ලබන යැපීම් දීමනාව,ගමන් වියදම් දිමනාව වව්චර් පත් මඟින් ගෙවීමට සිදුවේ.මෙම වව්චර් පත්‍ර පිරවීම සභිකයින්ට ගැටලු සහගත බැවින් රු.8000.00ක දිමනාව සභික දීමනාවට එකතු කොට ගෙවීම සඳහා ගරු ආණ්ඩුකාරතුමියගෙන් ඉල්ලා සිටීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

01. **කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම.**

2025.09.12 මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව,2025.09.22 පරිසර හා පොදු පහසුකම් කාරක සභා වාර්තාව, 2025.09.12 ,2025.09.24 කාර්මික සේවා කාරක සභා වාර්තාව, 2025.09.22 පුස්තකාල උපදේශන කමිටු වාර්තාව සභාගත කරන ලදි.

අදහස් දක්වමින් ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා විසින් 2025.09.24 කාර්මික සේවා කාරක සභා වාර්තාවේ තීරණ අංක 09 සංශෝධනය විය යුතු බවයි.

> එනම්,වාහන විෂය නිලධාරී එච්.ඉෂාරා මධුෂානි මියගේ ඉල්ලීම අනුව වාහන අලුත්වැඩියා කටයුතු ලේකම්තුමා,සභාපතිතුමා ,කමිටු සභාපතිතුමා දැනුවත් කර කාර්මික නිලධාරීගේ අධීක්ෂණය හා උපදෙස් පරිදී සභිකවරයෙකුගේ අධීක්ෂණය යටතේ වාහනය ගලවා දෝෂය හදුනාගෙන ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බවයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එම්. ප්‍රදීපා ඉඳුමිණී කුලරත්න මැතිතුමිය ප.ව.02.10ට සභාවෙන් පිටවන ලදි.

02. **ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ,එකතු කළ ආදායම පිළිබඳ ප්‍රගති වාර්තා ගරු සභාවට ඉදිරිපත් කිරීම-නැත**
03. **වෙනත් කරුණු**
    - **සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිළි කිරීම්**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.ඒ.ඉසුරු සම්පත් අලගියවන්න මැතිතුමා**

කමිටු වාර්තාවක් මහ සභාවට ඉදිරිපත් කිරීමට ප්‍රමාද වීම ,තීරණ ක්‍රියාත්මක කිරීමට ප්‍රමාද වීම තුලින් සභාව මඟින් ඉටුවන සේවය ප්‍රමාදයක් සිදුවේ.මේ නිසා කමිටු වාර්තා ඉදිරිපත් කිරීමට විධිමත් ක්‍රමවේදයක් සකසා ගත යුතු බව පැහැදිළ කරමි.

නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව තුල මා විසින් ප්‍රකාශිත කරුණක් එම කරුණට අදාළ පුද්ගලයාට ඔහුට විරුද්ධව කරුණු ප්‍රකාශ කළ ආකාරය පිළිබඳ කමිටු සාමාජිකයෙකු මාර්ගයෙන් දැනුවත් වීමක් සිදු වී තිබේ.එයට කිසිදු සභිකයෙකු මැදිහත් වී නොමැති බව මගේ අදහසයි.මෙය පුද්ගලිකව බලපාන කරුණක් ලෙසට පත්වී ඇත.කමිටු තීරණ පොදු තීරණ වන නිසා පෞද්ගලික අදහසක් ලෙස සමාජගත වීම වැරදි සහගත තත්වයකි.අනිවාර්යයෙන් මෙම කරුණ නිවැරදි විය යුතුය.

සභිකයින් කෙරෙහි පරුෂ වචනයෙන් බැණ වැදීම් 2025.10.02 හෝ ආසන්න දිනයකදී ප්‍රාදේශීය සභාවට පැමිණ පිටවීමේදී ළහිරු රියදුරුතුමා ධාවනය කරන කැබ් රථයේ පිටුපස අසුනෙහි අසුන්ගෙන සිටින අවස්ථාවේදී ප්‍රාදේශීය සභාවේ අධිකරණ කටයුතු නිලධාරීතුමා එම කැබ් රථයට ගොඩ වී මද වේලාවකින් රියදුරු මහතා සමඟ එදින සභාවේ කටයුත්තකය පැමිණි මා හට හා ගයාන් මන්ත්‍රීතුමා පදිංචි වී සිටින ප්‍රදේශයේ නම භාවිතා කරමින් පරුෂ වචනයෙන් අප දෙදෙනාට බැණවදින ලදි.එයට මා මැදිහත් නොවූ නිසා දුරදිග නොගොස් අවසන් විය.කිසිසේත්ම මෙ අනුමත කළ නොහැක.මා හා අනෙකුත් සියලුම සභිකයින් සභාවට පැමිණෙන්නේ අවශ්‍යතාවන් සපුරාලීමේ අරමුණෙන් පමණි.මෙම ආයතනයේ සේවකයින් සේවයේ යෙදෙන්නේ මහජන අවශ්‍යතා සපුරා ලීම සඳහාය.එනිසා ඔහුගේ එම ක්‍රියාව පහත් ලැජ්ජා සහගත ක්‍රියාවක් ලෙස පෙනේ.මේ සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සුදුසුය.

- **සභාපතිතුමාගේ ස්තුති කිරීම**

අද දින සභාවට පැමිණ සිටින පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රී තුමන්ලාට හා මන්ත්‍රී තුමියන්ලාටත් , ලේකම්තුමන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාට ස්තුතිය පුද කරමින් ගරු සභාපතිතුමාගේ ස්තුති කතාව අවසන් කරන ලදී.ව

ප.ව.2.45 ට පමණ සභාවේ කටයුතු අවසන් විය.

ගරු ප්‍රාදේශීය සභා .................................................................. මැතිතුමා/මැතිතුමිය ගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා ....................................................................... මැතිතුමා/මැතිතුමිය ගේ ස්ථිරත්වයෙන් සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත විය.

සභාපති
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව